# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

කළමනාකරණ ගිණුම්කරණයේ මූලික සංකල්ප ඇගයීමට ලක් කරයි.

**14, 15**

පිරිවැය හැසිරීම හා පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය තුළින් කළමනාකරණ තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක වෙයි - ව්‍යුහගත ප්‍රශ්න

1) පාසල් බෑග් නිෂ්පාදනය කරනු ලබන සමාගමක් S සහ T ලෙස නිෂ්පාදන දෙපාර්තමේන්තු 2 ක් සහ සේවා දෙපාර්තමේන්තුවක් ඇත.

දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් පහත තොරතුරු දී ඇත.

| විස්තරය | S | T | සේවා |
|---|---|---|---|
| යන්ත්‍ර පිරිවැය | 50,000 | 70,000 | 20,000 |
| වක්‍ර සේවක වැටුප් | 39,000 | 40,000 | 15,000 |
| භූමි ප්‍රමාණය (වර්ග මීටර්) | 12,000 | 9,000 | 6,000 |
| ශ්‍රම පැය | 1,000 | 2,000 | |
| යන්ත්‍ර පැය | 3,000 | 1,000 | |
| සේවක සංඛ්‍යාව | 50 | 30 | 10 |
| කිලෝ වොට් පැය | 3,000 | 3,000 | 2,000 |

ඉදිරි වර්ෂය සඳහා අයවැය ගත පිරිවැය තොරතුරු

| | | |
|---|---|---|
| ගොඩනැගිලි කුලී | - කර්මාන්ත ශාලාව | 90,000 |
| | - පරිපාලන ගොඩනැගිල්ල | 30,000 |
| යන්ත්‍ර ක්ෂය | | 70,000 |
| විදුලි වියදම් | - කර්මාන්ත ශාලාව | 80,000 |
| | - පරිපාලන ගොඩනැගිල්ල | 20,000 |
| කාර්යාල උපකරන ක්ෂය | | 18,000 |
| යන්තු රක්ෂණය | | 28,000 |
| සේවක රක්ෂණය | | 27,000 |
| ගිණුම් ලිපිකරු වැටුප | | 15,000 |

- සේවා අංශයේ පිරිවැය නිෂ්පාදන අංශ අතර සමානව නැවත විභජනය කරනු ලැබේ.
- නිෂ්පාදන සේවකයකු නිපදවන සෑම බෑගයකටම රු.250 බැගින් වන පරිදි 2021.03.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා නිෂ්පාදන සේවක වැටුප් රු.150,000 ක් ගෙවා ඇත.
- එක් බෑගයක් නිපදවීම සඳහා අමුද්‍රව්‍ය ඒකකයක් අවශ්‍ය වන අතරඅමුද්‍රව්‍ය ගැණුම් රු. 580,000 ක්

වේ. අමුද්‍රව්‍ය අවසන් තොගය රු.40,000 ක් වේ.

- S නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ පොදු කාර්ය පිරිවැය යන්ත්‍ර පැය මතද, T නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ පිරිවැය ශ්‍රම පැය මතද අන්තර්ග්‍රහණය කරනු ලැබේ.
- එක් බෑගයක් නිෂ්පාදනය කිරීම සඳහා යන්ත්‍ර පැය 2 ක් සහ ශ්‍රම පැය 3 ක් ගතවේ.
- බෑගයක විකුණුම් මිල මත ලාභ ආන්තිකය 20% කි.

අවශ්‍ය වන්නේ,

1. විභජන පදනම දක්වමින් පොදුකාර්ය පිරිවැය විශ්ලේශණ පත්‍රිකාව සේවා අංශයේ පොදුකාර්ය පිරිවැය නැවත විභජනය.
2. S සහ T අංශ දෙක සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාත.
3. බෑගයක නිශ්පාදන පිරිවැය.
4. බෑගයක අයවැය ගත විකුණුම් මිල.

2) සුවිමාල් ව්‍යාපාරය සෙල්ලම්බඩු නිශ්පාදන ආයතනයක් වන අතර.සෙල්ලම් කාර් රථ හා සෙල්ලම් බස් රථ නිපදවයි. මෙම නිෂ්පාදන ආයතනය සතුව “සැකසුම්” හා ”නිමවුම්” ලෙස නිෂ්පාදන අංශ දෙකක් හා “ගබඩා” යන සේවා අංශයක්ද පවතී. මෙම සියළුම අංශ එකම ගොඩනැගිල්ලක පවත්වා ගෙන යනු ලබන අතර පරිපාලන අංශයත් එම ගොඩනැගිල්ලෙහිම ස්ථාපනය කර ඇත.

අයවැය ගත පොදුකාර්ය පිරිවැය පහත දක්වා ඇත.

| **අයිතමය** | **මුළු පිරිවැය** | **සැකසුම්** | **නිමවුම්** | **ගබඩා** |
|---|---|---|---|---|
| වක්‍ර ද්‍රව්‍ය පිරිවැය | 400,000 | 200,000 | 200,000 | - |
| වක්‍ර වැටුප් | 1,200,000 | 600,000 | 400,000 | 200,000 |
| විදුලි වියදම් | 320,000 | ? | ? | ? |
| කුලී වියදම් | 600,000 | | | |
| යන්ත්‍ර නඩත්තු වියදම් | 380,000 | | | |
| ආරක්ෂක වියදම් | 240,000 | | | |
| ගබඩා පරිපාලන වියදම් | 40,000 | - | - | 30,000 |

අමතර තොරතුරු

- පොදුකාර්ය පිරිවැය විභජන පදනම් සහ අනෙකුත් තොරතුරු පහත දැක්වේ.

| **විස්තරය** | **සැකසුම්** | **නිමැවුම්** | **ගබඩා** | **පරිපාලන** |
|---|---|---|---|---|
| භූමි ප්‍රමාණය (වර්ග අඩි) | 40,000 | 30,000 | 20,000 | 10,000 |
| කිලෝවොට් පැය | 7,000 | 3,000 | 2,000 | 1,000 |
| ආරක්ෂක සේවක සංඛ්‍යාව | 5 | 3 | 2 | 2 |
| යන්ත්‍ර පිරිවැය | 2,000,000 | 1,800,000 | - | - |
| ඍජු ශ්‍රම පැය | 20,000 | 40,000 | | |

- රු. 80,000 වටිනා විදුලි බිල්පත ඉහත ගණනය කිරීම් වලට ගෙන නැත. විදුලි වියදම තුළ පරිපාලන කාර්යාලයට අදාල රු. 40,000 ක් ඇතුලත් වේ.
- කුලී වියදම් වල ඉදිරිය වර්ෂයට ඇස්තමේන්තු කල රු.20,000 ඇතුළත් වේ.
- යන්ත්‍ර ක්ෂය වීම් පිරිවැය මත 10 % කි.
- ගබඩාවේ පිරිවැය නිශ්පාදන දෙපාර්ථමේන්තු අතර 3:2 අනුපාතයට බෙදිය යුතුවේ.
- නිමැවුම් දෙපාර්තමේන්තුව සැකසුම් දෙපාර්තමේන්තුවේ පොදු කාර්ය පිරිවැය සෘජු ශ්‍රම පැය ගණන පදනම් කරගෙන අවශෝෂණය කරනු ලබයි.

- පහත අයවැයගත තොරතුරු සෙල්ලම් කාරයකට හා බස් රථයකට අදාල වේ.

| | සෙල්ලම් කාරය | සෙල්ලම් බස් රථය |
|---|---|---|
| සෘජු ශ්‍රම පැය ගණන - නිමැවුම් | 4 | 3 |
| - සැකසුම් | 5 | 4 |
| සෘජු ද්‍රව්‍ය පිරිවැය (රු) | 150 | 180 |
| සෘජු ශ්‍රම පිරිවැය (පැයකට රු.) | 100 | 150 |
| සෘජු වෙනත් වියදම් | 50 | 60 |

අවශ්‍ය වන්නේ,

1. පොදු කාර්ය පිරිවැය විභජන විශ්ලේශණ පත්‍රිකාව
2. පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය
3. සෙල්ලම් කාරයක හා සෙල්ලම් බස් රථයක මුළු නිශ්පාදන පිරිවැය
4. සෙල්ලම් කාරයක විකුණුම් මිල 20% පිරිවැයට ලාභ ආන්තිකයක් එකතු කර තීරණය කරනුයේ නම් සෙල්ලම් කාරයක විකුණුම් මිල
5. බස් රථයක විකුණුම් මිල තීරණය කරනුයේ විකුණුම් මිල මත 15 % නම් බස් රථයක ඇස්තමේන්තු ගත විකුණුම් මිල

3) විදුලි උපකරණ නිෂ්පාදන සමාගමක නිෂ්පාදන අංශ දෙකක් හා සේවා අංශයක් සහිතව ක්‍රියාත්මක වේ. 2022 ජනවාරි මාසයට අදාළ ඇස්තමේන්තු ගත මුළු පොදුකාර්ය පිරිවැය හා අනෙකුත් තොරතුරු පහත වේ.

| විස්තරය | නිෂ්පාදන අංශ | | සේවා අංශ |
|---|---|---|---|
| | 01 | 02 | 01 |
| සේවකයන් ගණන | 10 | 8 | 2 |
| යන්ත්‍ර වටිනාකම (රු.) | 1,400,000 | 800,000 | - |
| ක්‍රියාකාරී පැය ගණන | 2,000 | 1,500 | - |
| බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | 1,000 | 800 | 200 |

ඇස්තමේන්තුගත පොදුකාර්ය පිරිවැය පහත වේ.

| | (රු.) |
|---|---|
| කුලී හා වරිපනම් | 4,000 |
| වක්‍ර වැටුප් | 30,000 |



වාණිජ්‍ය අධ්‍යයන ශාඛාව

| | |
|---|---|
| යන්ත්‍ර රක්ෂණය | 220,000 |
| ඉන්ධන හා බලය | 70,000 |
| සේවක සුභසාධන වියදම් | 40,000 |

සේවා අංශයේ පොදුකාර්ය පිරිවැය නිෂ්පාදන අංශ වලට නැවත විභජනය කරනු ලබන්නේ සම සමව වන අතර, පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහනය කරනු ලබන්නේ යන්ත්‍ර ක්‍රියාකාරී පැය ගණන අනුවයි.

අවශ්‍ය වන්නේ,

1. සුදුසු විභජන පදනම් භාවිත කොට ගෙන පොදු කාර්ය පිරිවැය විභජන පත්‍රිකාව. (ප්‍රාථමික හා ද්විතීයික විභජනයද ඇතුලත්ව)
2. විදුලි උපකරණයක් නිපදවීම සඳහා නිෂ්පාදන අංශ 1 ට පැය 3 ක් හා නිෂ්පාදන අංශ 2 ට පැය 5 ක් ගතවේ නම් විදුලි උපකරණයක් නිපදවීමට අදාළ මුළු පොදුකාර්ය පිරිවැය කොපමණද ?
3. එක් විදුලි උපකරණයක් සඳහා දරන ප්‍රාථමික පිරිවැය රු. 7691.30 ක් නම් වැයවන මුළු පිරිවැය කොපමණද ?
4. පිරිවැයට 10 % ක ලාභ සහිතව අලෙවි කරයි නම් විදුලි උපකරණයක විකුණුම් මිල කොපමණද ?

4) නිර්මාණ මුද්‍රණ ආයතනය, මුද්‍රණ සහ පොත් බැඳීම් ලෙස නිෂ්පාදන අංශ 2 කින් යුතු කර්මාන්ත ශාලාවක් සහ කර්මාන්ත ශාලාවට අවශ්‍ය සේවා සැපයීම සඳහා ගබඩාවක්ද පවත්වා ගනී.

2021 පෙබරවාරි මාසයට අදාළව විශේෂිත පොතකට අදාළ අය-වැය ගත තොරතුරු පහත දැක්වේ.

| | කර්මාන්තශාලාව (රු) | ගබඩාව (රු) | එකතුව (රු) |
|---|---|---|---|
| විදුලි වියදම් | 90,000 | 10,000 | 100,000 |
| වක්‍ර වේතන | ? | ? | 140,000 |
| ගොඩනැගිලි කුලී | 150,000 | 30,000 | 180,000 |
| සේවක රක්ෂණය | 60,000 | 10,000 | 70,000 |
| යන්ත්‍ර ක්ෂය | 45,000 | - | 45,000 |
| යන්ත්‍ර රක්ෂණය | 60,000 | - | 60,000 |
| ආරක්ෂක සේවක වේතන | ? | ? | 50,000 |

අනෙකුත් තොරතුරු

| | මුද්‍රණ | පොත් බැඳීම් | ගබඩාව |
|---|---|---|---|
| සේවක සංඛ්‍යාව (වක්‍ර) | 20 | 10 | 5 |
| ආරක්ෂක සේවක සංඛ්‍යාව | 2 | 2 | 6 |
| භූමි ප්‍රමාණය - වර්ග මීටර් | 10,000 | 5,000 | 3,000 |
| යන්ත්‍ර - පිරිවැය (රු.) | 20,000 | 10,000 | - |
| යන්ත්‍ර ක්‍රියාකාරී පැය | 4,000 | 500 | - |
| ඍජු ශ්‍රම පැය | 1,000 | 5,000 | - |



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

| | | | |
|---|---|---|---|
| මාසය සඳහා කිලෝ වොට් | 2,000 | 1,000 | - |
| ගබඩා අංශයෙන් සේවා සැපයීම | 60% | 40% | - |

- මුද්‍රණ අංශය යන්ත්‍ර ක්‍රියාකාරී පැය මත ද පොත් බැඳීම් අංශය සෘජු ශ්‍රම පැය මතද පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරයි.
- මුද්‍රිත පොතක් සඳහා ,
    - සෘජු ද්‍රව්‍ය පිරිවැය රු 210 ක් ද , සෘජු ශ්‍රම පිරිවැය රු 140 ක්ද අවශය වේ.
    - මුද්‍රණ පැය 2 ක්ද ,පොතක් බැඳීම සඳහා පැය 2 ක් ද ගත වේ.
    - පිරිවැය මත 30%ක ලාභයක් සහිතව පොතක විකුණුම් මිල කිරීම සිදුවේ.

අවශ්‍ය වන්නේ ,

පෙබරවාරි මාසය සඳහා ,

1. පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව .
2. පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය
3. එක පොතක නිෂ්පාදන පිරිවැය.
4. පොතක විකුණුම් මිල.

5) පහත තොරතුරු නිෂ්පාදන ව්‍යාපාරයකට අදාළ වේ.

වැටුප් තොරතුරු 2022 මාර්තු මාසය

| | | |
|---|---|---|
| සේවක සංඛ්‍යාව | | 5 |
| සම්මත වැටුප් අනුපාතය | පැයකට | 400 |
| අතිකාල වැටුප් අනුපාතය | පැයකට | 650 |

සම්මත පැය සංඛ්‍යාව එක් සේවකයෙකු දිනකට පැය 06 බැගින් මසකට දින 20

එක් එක් සේවකයා වැඩ කළ කාලය පැමිණීමේ දීමනා හා ඔවුන්ගේ වැටුපෙහි අයකර ගැනීම් පහත දැක්වේ.

| සේවකයාගේ නම | වැඩ කළ පැය | පැමිණීමේ දීමනා | වැටුපෙන් අඩුකර ගැනීම් | |
|---|---|---|---|---|
| | | | වැටුප් අත්තිකාරම් | ණය වාරික |
| ශ්‍රීනාත් | 128 | 2,500 | 10,000 | |
| ජයනාත් | 120 | 2,000 | - | 12,000 |
| ලක්නාත් | 130 | 2,500 | 10,000 | - |
| ප්‍රියනාත් | 120 | 2,000 | - | 12,000 |
| සුවිනාත් | 114 | - | 10,000 | - |

අමතර තොරතුරු

- සියළුම සේවකයන් සමිති දායකය ලෙස රු. 200 ගෙවිය යුතු වේ.
- ශ්‍රීනාත් ව්‍යාපාරයේ පැරණිතම සේවකයා වන අතර ඔහු හවස් වරුව සුපරීක්ෂණ කටයුතු වලද යෙදීම නිසා ඔහුට මාසික අමතර දීමනාවක් ලෙස රු. 5,000 ක් හිමිවේ.
- සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකයන් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදල් දායකය | සේව්‍යයා | 15 % |
| | සේවකයා | 10 % |
| සේවක භාරකාර අරමුදල් දායකය | | 03 % |

(සියළුම ගෙවීම් මූලික වැටුප මත පදනම් වේ.)

අවශ්‍ය වන්නේ,

1. වැටුප් විශ්ලේශණ පත්‍රිකාව පිළියෙළ කරන්න. (වැටුප් ලේඛණය 2022 මාර්තු මාසය සඳහා)
2. 2022 මාර්තු මාසයේ ,
   - වැටුප් පාලන ගිණුම
   - සේවක අර්ථසාධක අරමුදල් ගිණුම
   - සේවක අර්ථසාධක අරමුදල් වියදම් ගිණුම

6) සීමිත අංජන පොදු සමාගමේ 2022 ජනවාර් මාසයේ සේවකයන්ගේ වැටුප් ගෙවීම් වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

- මාසයක් තුළ වැඩ කළ යුතු සම්මත පැය ගණන 160 කි.
- පැයක මූලික වැටුප රු. 1,200 කි.
- අතිකාල පැයක වැටුප මූලික වැටුපෙන් 150 % කි.
- මූලික වැටුප මත සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10 % ක් ද සේව්‍යයාගෙන් 15 % ක් ද සේවා නියුක්ති භාරකාර අරමුදලට සේවකයාගේ මූලික වැටුපෙන් 3 % ක් ද දායක විය යුතුය.
- සේවක සුභ සාධක සමිතිය වෙනුවෙන් රු.500 ක් මසකට සේවකයකුගෙන් අයකර ගනී.
- 2022 ජනවාරි මාසයට අදාළ සේවා කාලය පහත වේ.

| සේවකයා | ගත වන කාලය |
|---|---|
| රුවන් | 160 |
| සෙනුරි | 165 |
| බිනරි | 165 |
| නයෝමි | 155 |
| රවිඳු | 150 |

අවශ්‍ය වන්නේ,

1. 2022 ජනවාරි මාසයේ වැටුප් ලේඛණය
2. ආයතනයේ මුළු වැටුප් පිරිවැය
3. වැටුප් පිරිවැය ගිණුම් ගත කිරීමට අදාළ ජ'නල සටහන්

7) අමායා වෙළඳ ව්‍යාපාරයේ 2022 මාර්තු මාසයේ සේවක ගෙවීම් සම්බන්ධ පහත තොරතුරු දී ඇත.

- සේවකයන්ගේ මූලික වැටුප්
  කළමණාකරු රු. 86,000
  විකුණුම් සහායක රු. 44,000
  ගබඩා පාලක රු. 57,000

- 2022 මාර්තු මාසය සඳහා අතිකාල දීමනා,
  කළමණාකරු රු. 7,000
  විකුණුම් සහායක රු. 10,000
  ගබඩා පාලක රු. 5,000

- සියළුම සේවකයන්ගේ දළ වැටුපෙන් 2% ක් සේවක සුභසාධක අරමුදල වෙනුවෙන් අඩු කරනු ලැබේ.
- සේවක අර්ථසාධක අරමුදල (EPF) වෙනුවෙන් සේවක හා සේවය දායකත්වය දළ වැටුපෙන් 8% ක් හා 12% ක් වේ.
- සේවක භාරකාර අරමුදල (ETF) වෙනුවෙන් සේවා දායකත්වය දළ වැටුපෙන් 3% ක් වේ.
- විකුණුම් සහායක ගේ මාසික වැටුපෙන් රු.10,000 ක් ඔහුගේ ණය මුදලක් ගෙවීම වෙනුවෙන් අඩු කර වැටුප් ගෙවනු ලැබේ.
- එක් එක් මාසයේ EPF හා ETF අරමුදල් වෙනුවෙන් ගෙවනු ලබන මුදල් ප්‍රේශණය කරනුයේ පසුව එළඹෙන මාසයේ දෙවන සතියේදීය.
  ගෙවිය යුතු EPF රු. 42,000 (2022.02.28)
  ගෙවිය යුතු ETF රු. 6,300 (2022.02.28)

අවශ්‍ය වන්නේ,

1. පහත ආකෘතියට සමාන ආකෘතියක් භාවිතා කරමින් 2022 මාර්තු මාසය සඳහා වැටුප් ලේඛණය

| සේවකයාගේ නම | මූලික වැටුප | අතිකාල | දළ වැටුප | අඩු කිරීම් | | | මුළු අඩු කිරීම් | ශුද්ධ වැටුප | සේවා දායකය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | EPF | ණය | සුභ සාධක අරමුදල | | | EPF | ETF |
| | | | | | | | | | | |

2. අදාළ ගිණුම්
3. 2022.03.31 න් අවසන් මාසය සඳහා සේවකයින්ට අදාල මුළු වියදම. (එක් එක් වියදම් අයිතමය වෙන වෙනම දක්වන්න.)

8) සීමිත සුවජන සමාගම විසින් අලෙවි කරනු ලබන මුව ආවරණ වර්ගයකට අදාලව 2022 මාසයට පහත තොරතුරු සපයා ඇත.

| දිනය | විස්තරය | ප්‍රමාණය | ඒකක පිරිවැය |
|---|---|---|---|
| 2022.01.01 | ශේෂය | 2,000 | 50 |
| 2022.01.03 | ගැණුම් | 3,000 | 60 |
| 2022.01.08 | විකුණුම් | 2,500 | ? |
| 2022.01.15 | විකුණුම් | 1,500 | ? |
| 2022.01.18 | ගැණුම් | 3,000 | 65 |
| 2022.01.25 | විකුණුම් | 3,000 | ? |
| 2022.01.31 | ගැණුම් | 3,000 | 70 |

(අ) අවශ්‍ය වන්නේ,

1. හරිත සාමාන්‍ය මිල ක්‍රමය අනුව 2022.01.31 දින තොගයේ පිරිවැය කොපමණද ?
2. හරිත සාමාන්‍ය මිල ක්‍රමය අනුව ජනවාරි මාසයේ විකුණුම් පිරිවැය ?

(ආ) මෙම ව්‍යාපාරයේ තොග මට්ටම් සම්බන්ධයෙන් පහත තොරතුරු ඔබට සපයා ඇත.

| | පරිභෝජනය (මාසික) | පොරොත්තු කාලය (මාස) |
|---|---|---|
| උපරිම | 3,500 | 4 |
| අවම | 2,000 | 2 |

අවශ්‍ය වන්නේ,

1. යළි ඇණවුම් ප්‍රමාණය
2. යළි ඇණවුම් මට්ටම
3. උපරිම තොග මට්ටම

9) පහත තොරතුරු අනුරාධ පොදු සමාගමට අදාල වේ.
2022 ජුනි මාසයට අදාළව ගබඩා ලෙජරයෙන් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

| දිනය | අමුද්‍රව්‍ය ලැබීම් | අමුද්‍රව්‍ය නිකුත් කිරීම් | ශේෂය |
|---|---|---|---|
| 01/06 | | | 2,000 kg එකක් රු. 800 බැගින් |
| 03/06 | 5,000 kg එකක් රු.900 බැගින් | - | ? |
| 12/06 | 3,000 kg එකක් රු. 1,200 බැගින් | - | ? |
| 16/06 | - | 6,000 kg | ? |
| 20/06 | 2,000 kg එකක් රු.1,400 බැගින් | - | ? |
| 25/06 | | 5,500 kg | ? |

මාසික උපරිම තොග භාවිතය 4,500 kg වන අතර අවම තොග භාවිතය 2,500 kg වේ. පොරොත්තු කාලය උපරිම මාස 4 ක් වන අතර අවම පොරොත්තු කාලය මාස 2 කි. වාර්ෂික තොග ඉල්ලුම 12,000 kg වන අතර තොග රඳවා ගැනීමේ කාලය ඒකකයකට රු. 4 ක් වන අතර තොග ඇණවුමක පිරිවැය රු. 600 කි.

1. යළි ඇනවුම් මට්ටම
2. අවම තොග මට්ටම
3. ආර්ථික ඇණවුම් ප්‍රමාණය
4. ව්‍යාපාරය හරිත සාමාන්‍ය තොග ක්‍රමය (WAC) භාවිතා කරයි නම් ව්‍යාපාරයේ මුළු තොග පරිභෝජනය ගණනය කරන්න.
5. ව්‍යාපාරය ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු ක්‍රමය භාවිතා කරයි නම් අවසාන තොගයේ වටිනාකම ගණනය කරන්න.

10) පහත දැක්වෙන්නේ සමන්තගේ ව්‍යාපාරයේ තොග වලට අදාළ තොරතුරු වේ.

| දිනය | විස්තරය | මිල (රු.) | ගැණුම් මිල (රු.) | ඒකක ප්‍රමාණය |
|---|---|---|---|---|
| 2022.04.01 | ශේෂය | | 20 | 1,000 |
| 2022.04.03 | ගැණුම් | | 22 | 500 |
| 2022.04.05 | ගැණුම් | | 23 | 400 |
| 2022.04.08 | විකුණුම් | 25 | | 800 |
| 2022.04.12 | ගැණුම් | | 24 | 700 |
| 2022.04.20 | විකුණුම් | 27 | | 1,000 |
| 2022.04.26 | ගැණුම් | | 25 | 500 |
| 2022.04.30 | විකුණුම් | 28 | | 300 |



වාණිජ ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

අවශ්‍ය වන්නේ ; පෙර පිවිසි පෙර පිට ක්‍රමය (FIFO) යොදා ගනිමින්

1. අවසන් තොගයේ පිරිවැය
2. විකුණූ තොගයේ පිරිවැය
3. දළ ලාභය

11) පාසලක වාණිජ සංගමය සංවිධානය කරන තෙදින උසස් පෙළ වාණිජ විෂය සම්මන්ත්‍රණයක් සඳහා පහත තොරතුරු අදාළ වේ.

| | | රු. |
|---|---|---|
| සම්මන්ත්‍රණ ශාලා කුලිය | ( දිනකට ) | 50,000 |
| දේශක ගාස්තු | ( දිනකට ) | 20,000 |
| සෞඛ්‍යය උපදේශන සහිත දැන්වීම් මුද්‍රණය සඳහා | | 4,000 |
| සංග්‍රහ වියදම් - දේශකයන් සඳහා ( දින 3කට ) | | 6,000 |
| - සිසුන් සඳහා | (එක් සිසුවකුට ) | 100 |
| මුඛ ආවරණ ( එක් සිසුවකු සඳහා ) | | 30 |
| වතුර බෝතල් ( එක් සිසුවකු සඳහා ) | | 20 |
| නිබන්ධන වියදම් ( එක් සිසුවකු සඳහා ) | | 50 |

- එක් දිනයකදී එක් විෂයක් සාකච්ඡා කිරීමට අපේක්ෂිත අතර සියලුම සිසුන් විෂයන් තුනම සඳහා සහභාගී වීම අනිවාර්ය වේ.
- අත් සේදීම හා විෂබීජ නාශක දියර සඳහා පාසල් වාණිජ සංගමය විසින් රු.10,000ක වියදමක් දරා ඇත.
- සහභාගී වන සිසුවෙකුගෙන් අයකළ ගාස්තුව (දින 3 කට ) රු. 500කි.

අවශ්‍ය වන්නේ,

1. සම්මන්ත්‍රණයේ මුළු ස්ථාවර පිරිවැය.
2. එක සිසුවකුගේ දායකය.
3. සම්මන්ත්‍රණය සඳහා සිසුන් 1,500ක් සහභාගී වුයේ නම් ලැබෙන අතිරික්තය.
4. රු. 20,000ක් වාණිජ සංගමය පරිත්‍යාග කරන්නේ නම් සහභාගී විය යුතු සිසුන් සංඛ්‍යාව.
5. සහභාගි වන සියලු සිසුන් සඳහා අමතර ප්‍රශ්න පත්‍ර කට්ටලයක් රු. 200 බැගින් අයකර ලබාදීම සහ එම ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සඳහා අමතර මුද්‍රණ වියදම් රු. 100 වැය වන්නේ නම් සහභාගී විය යුතු සිසුන් සංඛ්‍යාව.

12) ප්‍රධාන නගරයක බාලිකා පාසලක වාණිජ අංශයේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව දෙසැම්බර් මස මුල්සතිය තුළ යාමට සංවිධානය කිරීමේදී පහත ඇස්තමේන්තුව ලබා දී ඇත.

- සහභාගීවන සිසුන් ගණන - 190
- චාරිකා දින ගණන (රාත්‍රී 1) - 2
- සහභාගී වන ගුරු මහත්මීන් ගණන - 10



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

- ශිෂ්‍යාවන් 40 ක් බැගින් නවාතැන් ගත හැකි නේවාසිකාගාරය සඳහා එක් රාත්‍රියට රු. 25,000 ක් වැය වේ.
- බස් රථ 5 ක් යොදා ගන්නා අතර එක් බස් රථයකට රු. 80,000 ක් වැයවේ.
- ආහාර සඳහා එක් අයෙකුට රු. 1,000 ක් දිනකට වැය වන අතර, වතුර බෝතල් සඳහා දිනකට රු. 200 ක් වැයවේ.
- ශිෂ්‍යාවකට ටී ෂර්ට් එකක් හා කැප් එකක් ලබා දීමට රු. 1,500 ක් වැයවේ.
- රාත්‍රී රසාස්වාදන වැඩ සටහන සඳහා සංගීත කණ්ඩායමට යන වියදම රු. 100,000 කි.
- සනීපාරක්ෂක ද්‍රව්‍ය සඳහා දිනකට රු. 50 බැගින් දින දෙකට එක් අයෙකුට රු. 100 ක් වැයවේ.

- ගුරුවරුන් සඳහා මුදල් අයකිරීමක් නොකරන අතර, ඔවුන් සඳහා ද සියළුම වියදම් සිසුන් දැරිය යුතුය.

අවශ්‍ය වන්නේ,

1. ස්ථාවර පිරිවැය
2. ඒකකයක විචල්‍ය පිරිවැය
3. එක් ශිෂ්‍යාවකගෙන් අය කල යුතු මුදල
4. ඒකක දායකය
5. රු. 95,000 ක මුදලක් පාසලේ වානිජ සංගමයට පරිත්‍යාග කිරීමට අපේක්ෂා කරන්නේ නම්, එක් අයකුගෙන් අය කල යුතු මුදල කොපමණද?

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව